දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල , )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )FHB/AYH/temp/Let-01/2024
எனது இல )
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය ) 23 /01/2024
திகதி )
Date

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார் அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංකය: 01-03/2024

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
සියලුම වෛද්‍ය ආයතන භාර ප්‍රධානින්
අධ්‍යක්ෂ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්

## ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් ලබාගත් නව යෞවන යෞවනියන් සඳහා පසුවිපරම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ 2011.03.07 දිනැති අංක 02-29/2011 දරණ පොදු චක්‍රලේඛය සහ 2015.07.08 දිනැති අංක 01-25/2015 දරණ පොදු චක්‍රලේඛයටත් පවුල් සෞඛ්‍ය කාර්යාංශය මඟින් 2016 වර්ෂයේ දී නිකුත් කළ "සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා නව යොවුන් ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් ලබා දීම පිළිබඳ මාර්ගෝපදේශය" ට ත් වැඩිමනත් වශයෙන් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

නව යෞවන යෞවනියන් වෙත ගුණාත්මක ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවක් ලබා දීම හේතුවෙන් අඩු වයස් ගැබ් ගැනිම් මෙන්ම ඒ ආශ්‍රිතව ඇතිවන සංකූලතා සහ මාතෘ මරණ සැලකිය යුතු ලෙස අඩුවී ඇති බව පැහැදිළිය.

ඉහත චක්‍ර ලේඛයට අනුව, රාජකාරියේ නිරත වෛද්‍යවරයා විසින් එක් එක් සිද්ධියට අනුකූලව තක්සේරු කර අවශ්‍යතාවය අනුව නව යොවුන් දරුවාගේ උපරිම සුභසිද්ධිය සැලකිල්ලට ගනිමින් ඔවුන්ට ප්‍රතිසංධිරෝධක හෝ පවුල් සැලසුම් සේවා ලබා දීම සිදු කෙරේ. වයසට අදාලව යෞවන යෞවනියන්හට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවා ලබා දීමේදී ඔවුන්ගේ පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා වන අයුරින් ක්‍රියාකිරීමට වග බලා ගත යුතුය.
පවුල් සැලසුම් සේවා ලබා ගත් නව යොවුන් ගැහැණු දරුවන්ගේ සෞඛ්‍යමත් බව, යහපැවැත්ම හා ආරක්ෂාව උදෙසා ඔවුන් වැඩිහිටියකු බවට පත්වනතෙක්(උදා: වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් පහත සඳහන් පසුවිපරම් ක්‍රම වේදයන් අනුගමනය කිරිම අත්‍යාවශ්‍ය වේ.

1. පවුල් සංවිධාන ක්‍රම ලබාගත් සියලුම නව යොවුන්වියේ ගැහැණු දරුවන් සමීපව පසුවිපරම් කළ යුතුය.පවුල් සැලසුම් සේවාව ලබාදී මසකට පසු අදාළ ක්ෂේත්‍ර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් මුලික ගෘහ පිවිසුම් පසුවිපරම සිදු කළ යුතුය.

2. ඉන් අනතුරුව සිදුකරන අනුගාමි පසුවිපරම් තුන්මසකට වරක් සිදුකළ යුතුය. ලබාගත් පවුල් සැලසුම් ක්‍රමයට අදාලවන පරිදි සායනයේදි හෝ ගෘහ පිවිසුම් වලදී මෙම අනුගාමි පසුවිපරම් සිදුකළ හැක.

3. එම පසුවිපරම් වලදි පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුය.

- නව යොවුන් සේවාලාභියාට සපයනු ලැබු පවුල් සැලසුම් ක්‍රමය නිවැරදිව සහ අඛණ්ඩව භාවිතා කිරීමට ඔවුන් කටයුතු කරන බව හා ඒ මගින් ඇතිවිය හැකි අතුරු අබාධ පිළිබඳ තක්සේරු කොට අවශ්‍ය උපදේශනය සිදුකළ යුතුය.

o යම් විශේෂිත කරුණක් ගැන සැලකිලිමත් විය යුතු අවස්ථාවලදී හෝ අදාල යුවල තවදුරටත් සහවාසයේ නොයෙදෙන විට, එම පවුල් සැලසුම් ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රමුඛ සෞඛ්‍ය සේවා කණ්ඩායම විසින් නැවත තක්සේරු කොට ඒ සම්බන්ධයෙන් අදාල නවයොවුන් ගැහැණු දරුවා සහ දෙමාපියන්/ භාරකරුවන් සමඟ සාකච්ඡා කළ යුතුය.

- පවුල් සැලසුම් ක්‍රමය දිගටම පවත්වාගෙන යැමේ අවශ්‍යතාවය ඇතිවිට දෙමාපිය හෝ භාරකරුගේ කැමැත්ත ලබාගත යුතුය.( යෞවන යෞවනියන් සඳහා ප්‍රජනක සෞඛ්‍ය සේවා සැපයීම පිළිබඳ 2015.07.08 දිනැති අංක 01-25/2015 දරණ පොදු චක්‍රලේඛයට අනුව )

  පවුල් සැලසුම් සේවාවක් ලබාගත් නව යොවුන් ගැහැණු දරුවාගේ ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳව අවධානය යොමුකළ යුතු යම් කරුණක් ඇත්නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත හෝ එම අධිකාරියේ අදාල ක්ෂේත්‍ර නිලධාරිය වෙත දැනුම් දිය යුතුය.එවැනි අවස්ථා පිළිබඳව සටහන් තබා ගත යුතු අතර අදාල වාර්තාවල රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය.

4. අනුගමනය කළ පියවරයන් සහ තොරතුරු හුවමාරු කිරීම් වලට අදාල ලියකියවිලිවල පිටපත් නව යොවුන් සේවාලාභියාගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය අරක්ෂා වන පරිදි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ කාර්යාලයේ සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ අරක්ෂිතව තබා ගත යුතුය.

සටහන් - පවුල් සැලසුම් ක්‍රම භාවිතය නිසා ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු,අතුරු ආබාධ හා සංකුලතා පිළිබඳව ජාතික පවුල් සැලසුම් ප්‍රතිපත්තිමය නිර්දේශයන්ට අනුව කටයුතු කළ යුතුය.(හෝමෝන නැන්පතු ඇතුලු කිරිම සහ ඉවත් කිරිම සම්බන්ධයෙන් සේවා සපයන්නන් සඳහා මාර්ගෝපදේශය, ගිලින පෙති භාවිතය පිළිබඳ සේවා සපයන්නන් සඳහා මාර්ගෝපදේශ, පවුල් සංවිධාන නික්ෂේපන භාවිතය පිළිබඳ සේවා සපයන්නන් සඳහා උපදෙස් මාලාව
(https://fhb.health.gov.lk/index.php/en/technical-units/family-planning-unit)
වැඩිදුර තොරතුරු සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ නව යොවුන් සහ යොවුන් සෞඛ්‍ය ඒකකය ඇමතීමෙන් අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.(දුරකථන අංක 011-2699341,email : ayhunitfhb@gmail.com )
මෙම චක්‍රලේඛයේ අන්තර් ගත කරුණු ඔබගේ පරිපාලනය යටතේ සිටින සියළුම ආයතන සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබාදිය යුතු අතර අදාල අවස්ථාවලදී මෙම උපදෙස්වලට අනුගතව කටයුතු කරන බවට වගබලාගත යුතුය.

.........................................................
වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් .
ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය
සියලුම පලාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පලාත් සෞඛ්‍ය ලේකම්වරුන්
අතිරේක ලේකම් මහජන සෞඛ්‍ය සේවා සහ වෛද්‍ය සේවා,සෞඛ්‍ය අමාත්‍යාංශය
සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් , සෞඛ්‍ය අමාත්‍යාංශය
නිතීමය කටයුතු පිළිබඳ ප්‍රධාන නිලධාරී සෞඛ්‍ය අමාත්‍යාංශය
සියලුම පලාත්/ දිස්ත්‍රික් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්
සියලුම මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්
සභාපති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
සභාපති ශ්‍රී ලංකා ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය
සභාපති ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්ගේ සංගමය
සභාපති ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥවරුන්ගේ සංගමය
ශ්‍රී ලංකා නියෝජිතවරුන් (ලෝක සෞඛ්‍ය සංවිධානය/ එක්සත් ජාතින්ගේ ජනගහන අරමුදල /එක්සත් ජාතින්ගේ ළමා අරමුදල)